**මාර්ග සංවර්ධන අධිකාරිය - 2012**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලරාගිප්‍ර) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන හා සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කරන ලද රු.32,648,921,966 ක් වූ රජයේ ප්‍රදානවලට අදාළ කාර්යයන් සාධාරණව ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි හා මූල්‍ය පාලන පිළිබඳ වර්ධනය ඇතිවන පරිදි අධිකාරිය විසින් හෙළිදරව් කර නොතිබුණි.

**1.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රීලංරගිප්‍ර)**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් බදු පදනම මත සපයන ලද මෝටර් වාහන 9 ක රු.මිලියන 48.45 ක් වූ පිරිවැය 2012 වර්ෂයේදී ගිණුම් ගත කර තිබුණි. කෙසේ වුවද 2011 වර්ෂය සඳහා රු.මිලියන 3.79 ක් වූ ක්‍රමක්ෂය පිරිවැය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 හි අවශ්‍ය පරිදි අතීතානුයෝගීව ගිණුම්වල ගලපා නොතිබුණි.

(ආ) රු.මිලියන 17.90 ක් වටිනා වාහනයක් 2010 නොවැම්බර් 26 දින කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියෙන් අධිකාරියට මාරු කර තිබුණි. කෙසේ වුවද 2010 වර්ෂය සඳහා වාහනය ගිණුම්ගත කර නොතිබුණි. ඒ වෙනුවට එය 2012 වර්ෂය

සඳහා ගිණුම්ගතකර තිබුණි. තවද 2010 හා 2011 වර්ෂ සඳහා රු.මිලියන 3.78 ක් වූ ඒ සඳහා ක්ෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත -03 හි අවශ්‍ය පරිදි අතීතානුයෝගීව ගිණුම්වල ගලපා නොතිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

--------------------

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශ මූල්‍යයන ව්‍යාපෘතිවලින් හා මහාමාර්ග දෙපාර්තමේන්තුවෙන් පවරන ලද ඉඩම්වල වටිනාකම සහ අධිකාරියේ කාර්යයන් සඳහා යොදා ගන්නා ලද නාරාහේන්පිට දාබරේ මාවතේ පිහිටි මකුළුදෙණිය නම් ඉඩමේ කැබලි 36 කින් හෙක්ටයාර් 0.62018 ප්‍රමාණයක වූ කැබලි 21 ක් අගය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ආ) කඩුවෙල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ උඩුමුල්ල පිහිටි හෙක්ටයාර් 1.1304 ක ප්‍රමාණයක ඉඩමක් අත්කරගෙන 2002 ජූනි 05 දින වන්දි ලෙස රු.මිලියන 56 ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගෙවා තිබුණි. කෙසේ වුවද මෙය අධිකාරියේ වත්කමක් ලෙස දක්වා නොතිබුණි.

(ඇ) හෙක්ටයාර් 2 ක ප්‍රමාණයක් වූ ඔරුගොඩවත්ත පිහිටි වදුලවත්ත ඉඩම රු.5,875,788 ක තක්සේරුවකට 2010 පෙබරවාරි 24 දින අත්කර ගෙන තිබුණි. එහෙත් මෙම ඉඩමේ වටිනාකම රු.373,786 ක් ලෙස රු.5,502,002 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) දේශීය බැංකු මූල්‍යයන මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතියේ (Local Bank Funded Road Rehabilitation Project) මූල්‍ය ප්‍රකාශන වෙනම පිළියෙල කළ යුතු වුවද, ව්‍යාපෘතියේ මෙහෙයුම් ප්‍රතිඵල අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට ඒකාබද්ධ කර තිබුණි.

(ඉ) ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ බදු ඉඩමක් සඳහා බදු කුලී ගෙවීම් පිළිබඳ සාවද්‍ය ගිණුම් තැබීමක් හේතුවෙන් කෙරීගෙන යන වැඩ හා සමුච්චිත ලාභ රු.7,000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ලබා නොගන්නා ලද විවේක නිවාඩු සඳහා මුදල් ගෙවීමට ප්‍රතිපාදන සැලසීම සඳහා අධිකාරිය විසින් වර්ෂය අවසානයේදී රු.3,025,234 ක් වූ සාවද්‍ය ජර්නල් සටහන්

අනුමත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අධිකාරියේ ඌනතාවය හා උපචිත වියදම් රු.3,025,234 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) සේවා දයක තැන්පතු ගිණුම හර කිරීම හා රඳවා ගත් ලාභ ගිණුම බැර කිරීම මඟින් රු.3,012,980 ක් සඳහා සාවද්‍ය ජර්නල් සටහනක් වර්ෂය අවසානයට අනුමත කර තිබුණු බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස එම මුදලින් අධිකාරියේ හිමිකම් හා ජංගම වගකීම් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩමක් බදු කුලී පදනම මත අධිකාරිය විසින් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන තිබූ අතර බදු කරු සමඟ පෙර කුලී ගිවිසුම අවලංගු කිරීම සඳහා වූ වන්දියක් ලෙස රු. මිලියන 50 ක මුදලක් 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා අවස්ථා තුනකදී ආගමික ආයතනයකට ගෙවා තිබුණි. කෙසේ වුවද මුළු වන්දි මුදලින් රු.මිලියන 30 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගිණුම්ගත කර බදු ඉඩමේ පිරිවැය ලෙස දක්වා තිබූ අතර ඉතිරි රු.මිලියන 20 ක් වූ ශේෂය 2009 වර්ෂයේදී පරිපාලන වියදම්වලට සාවද්‍යව අයකර තිබුණි.

(එ) දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය විසින් රු.මිලියන 1,113.33 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද අති නවීන වාහන 77 ක් හා පිරිවැය රු. මිලියන 5.4 කට මිලදීගත් වාහනයක් පිළිවෙලින් 2011 හා 2012 වර්ෂවලදී අධිකාරියට භාරදී තිබූ නමුත් ලෙජර ගිණුම්වලට ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඒ) 2012 වර්ෂයේදී අධිකාරිය විසින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සහාය ඇතිව දිවයින පුරා සවිකරන ලද පෙරමුසු නිෂ්පාදන පිරියත 13 ක වටිනාකම නිශ්චය කර ගිණුම්ගත කර නොතිබූ අතර, රු. 124,165,390 ක්වූ සවිකිරීම් පිරිවැය පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි. එබැවින් යන්ත්‍රෝපකරණ යටතේ දැක්වෙන පිරියත වටිනාකම හා ලැබුණු රජයේ ප්‍රදාන අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) දක්ෂිණ අධිවේගී මාර්ගයේ ආරම්භක උත්සවය සඳහා වැය කරන ලද රු.17,739,681 ක මුදල දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියෙන් ලැබිය යුතු මුදලක් ලෙස 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඕ) රු.1,121,546 ක් වූ මඩකලපුව නිල නිවාසයෙහි අළුත්වැඩියා කාර්යයන් සඳහා පිරිවැය, ගොඩනැගිලි වැඩි දියුණු කිරීම යටතේ දක්වනු වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ක) වයඹ පළාත් කාර්යාලය විසින් දරන ලද එකතුව රු.1,482,503 ක්වූ ගොඩනැගිලි නඩත්තු පිරිවැය, ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ග) රු. මිලියන 2.4 ක් වූ ත්‍රිකුණාමලයේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය හා සේවක නිල නිවාස ප්‍රතිසංස්කරණය කිරීමේ පිරිවැය එහි ප්‍රාග්ධන ස්වරූපය සැලකිල්ලට ගැනීමෙන් තොරව 2012 වර්ෂයේදී මාර්ග අංශ සහාය ව්‍යාපෘතියෙන් ලද ප්‍රදානවලට එරෙහිව ලියා හැර තිබුණි.

(ඡ) විවිධ කාර්යයන් සඳහා දරන ලද රු.4,481,450 ක් වූ ප්‍රචාරණ වියදම් කෑගල්ල නගරයේ අතුරු මාර්ගය ඉදිකිරීමේ වැඩ සඳහා වූ පිරිවැය යටතේ සාවද්‍යාව දක්වා තිබුණි.

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද එකතුව රු.77,040,957 ක්වූ වැඩ පූර්ව අත්තිකාරම් වර්ෂ 3 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

### 1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනත<br>(i) 8(1) වගන්තිය | 2011 සැප්තැම්බර් 30 ට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතුව තිබූ මාර්ග සංවර්ධන අධිකාරියේ 2012 වර්ෂය සඳහා අයවැය ලේඛනය අනුමත කර තිබුණේ 2012 නොවැම්බර් 12 දිනදීය. |
| (ii) 14(1) වගන්තිය | අදාළ අමාත්‍යාංශයට හා විගණකාධිපති වරයාට පිටපත් ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ පිළියෙල කළ |

| | | |
|---|---|---|
| | | යුතු 2012 වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2013 ජූනි 30 වන විටත් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| (i) | 2005 ජනවාරි 31 දිනැති අංක පීඊඩී/28 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | රු.46,239,371 ක් වටිනා වාහන 17 ක් හා රු.28,573,096 ක් වටිනා වාහන 02 ක් මිලදී ගැනීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) | 2007 දෙසැම්බර් 18 දිනැති අංක පීඊඩී/47 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | 2011 සිට 2015 දක්වා සංයුක්ත සැලැස්ම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පිළියෙල කර අනුමත කර තිබූණේ 2013 මැයි 15 දින දීය. 2012 සිට 2016 දක්වා සංයුක්ත සැලැස්ම 2013 අගෝස්තු 31 වන විටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණි. |
| (iii) | 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 08 ඡේදය | 2011 වර්ෂයේදී ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලද අරමුදල් යටතේ රු. මිලියන 136 ක් වටිනා නව වාහන 23 ක් අධිකාරියට ලබාදී තිබුණු අතර, අධිකාරිය විසින් අපහරණය කළ යුතු වාහන 113 ක ලැයිස්තුවක් පිළියෙල කර තිබුණි. කෙසේ වුවද, 2012 දෙසැම්බර් 31 දිනට වාහන 13 ක් පමණක් අපහරණය කර තිබූ අතර එම වාහන විකිණීමෙන් ලත් රු.7,157,449 ක මුදල සහ ඉහත ලැයිස්තුවේ ඇතුළත් නොවූ වෙනත් වාහන 06 ක් විකිණීමෙන් ලත් රු.3,453,724 ක් වූ මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (සී) | මාර්ග සංවර්ධන අධිකාරියේ 2011 ඔක්තෝබර් 17 දිනැති අංක 327 දරන මුදල් චක්‍රලේඛය. | අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ අංශ දෙකකට හා උප කාර්යාල 22 කට ලබාදී තිබූ එකතුව රු.894,169 ක්වූ සුළු මුදල් අග්‍රිම හා උප කාර්යාල 06 කට ලබාදී තිබූ එකතුව රු.209,348 ක් වූ ඉන්ධන අග්‍රිම චක්‍රලේඛයේ දී තිබූ උපදෙස් පරිදි වර්ෂය අවසානයට නිරවුල් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු. මිලියන 547 ක බදු පූර්ව ශුද්ධ ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු. මිලියන 385 ක බදු පූර්ව ශුද්ධ ඌනතාවයක් වූ හෙයින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල රු. මිලියන 162 ක අඩුවීමක් දැක්වුණි. දකුණු අධිවේගී මාර්ගයේ රු.මිලියන 688 ක අතිරික්තයක් තිබුණද, පුද්ගලික පඩිනඩි , සෘජු ශ්‍රමය, වෙනත් පරිපාලන පිරිවැය හා සේවාදායක වැඩ රු.මිලියන 829 කින් වැඩිවී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ අඩුවීමට මෙය හේතුවී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

දක්ෂිණ අධිවේගී මාර්ගයේ ආදායම හා පිරිවැය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සඳහා අධිකාරියේ කටයුතු වලින් වූ ප්‍රතිඵලය ශුද්ධ ඌනතාවයක් හෙයින් සමුච්චිත ඌනතාවයෙහි ශුද්ධ වැඩිවීමක් දැක්වේ.

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන සැලකිය යුතු විෂයයන් කිහිපයක් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | **2012** | **2011** |
| | **රු.මිලියන** | **රු.මිලියන** |
| ශුද්ධ ජංගම වත්කම් | (3,170) | (4,482) |

| | | |
|---|---|---|
| ශුද්ධ වත්කම් | 69,355 | (3,109) |
| සමුච්චිත ඌනතාවය | (8,205) | (5,439) |

2012 වර්ෂය තුළ දක්ෂිණ අධිවේගී මාර්ගයේ පිරිවැය රු.මිලියන 76,444 කින් ප්‍රාග්ධනිත කිරීම අධිකාරියේ ශුද්ධ වත්කම් වැඩිවීමට හේතුවී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

**3.1.1 අධිකාරියේ වාණිජමය නොවන කාර්යයන්**

**(අ) ජාතික මාර්ග හා පාලම් නඩත්තු කිරීම**

පාලම් හා ගුවන් පාලම් නඩත්තු කිරීම පිළිබඳ මුදල් වෙන්කිරීම හා තථ්‍ය වියදම් පහත පරිදි වේ.

| | 2012 වර්ෂය සඳහා ආරම්භක වෙන්කිරීම | සංශෝධිත වෙන්කිරීම | තථ්‍ය වියදම | උපයෝජනය ආරම්භක වෙන්කිරීමේ ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | % |
| සාමාන්‍ය නඩත්තුව | 1,296.8 | 2,807.4 | 2,830.8 | 218 |
| අඛණ්ඩ නඩත්තුව | 689.2 | 882.0 | 878.1 | 127 |
| කාලීන නඩත්තුව | 1,579.6 | 558.5 | 552.9 | 35 |
| කාණු පද්ධති නඩත්තුව | 861.3 | 132.0 | 126.6 | 15 |
| සංඥා පහන් නඩත්තුව | 483.5 | 132.5 | 128.8 | 27 |
| හදිසි හා ස්වාභාවික ආපදා යටතේ නඩත්තු වැඩ | 569.1 | 982.6 | 978.6 | 172 |
| තොටුපොළ මෙහෙයුම් හා නඩත්තුව | 20.5 | 5.0 | 4.2 | 20 |
| එකතුව | 5,500.0 | 5,500.0 | 5,500.0 | |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

තථ්‍ය උපයෝජනය හා ආරම්භක වෙන්කිරීම අතර පරතරය අවම කිරීමට හැකිවන පරිදි වර්ෂය අවසානයට ආරම්භක පළාත් අනුව වෙන්කිරීම අධිකාරිය විසින් නැවත ගලපා තිබුණි. ආරම්භක වෙන්කිරීම සමඟ සැසඳීමේදී පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සාමාන්‍ය නඩත්තුව සඳහා උතුරු පළාත හැර ඉතිරි පළාත් ඒවායේ වෙන්කිරීම ඉක්මවා තිබුණි.

(ii) පළාත් කාර්යාල හතක් විසින් අඛණ්ඩ මාර්ග නඩත්තු කටයුතු ඉක්මවා තිබුණි.

(iii) කාලීන මාර්ග නඩත්තුව හා කාණු පද්ධති නඩත්තුව සඳහා වෙන්කිරීම සියළුම පළාත් විසින් ඌන උපයෝජනය කර තිබුණි. තවද සංඥා පහන් නඩත්තු කාර්යයන් සඳහා සලසන ලද රු. මිලියන 483 ක්වූ මුළු වෙන්කිරීමෙන්, රු.මිලියන 128.8 ක් පමණක් උපයෝජනය කර තිබුණි. අක්කරෙයිපත්තු අතිරේක පළාත් කාර්යාලය විසින් ප්‍රවාහන සංඥා පහන් නඩත්තුව සඳහා රු.මිලියන 4.89 ක් සහ කාණු පද්ධති නඩත්තුව සඳහා රු. මිලියන 32 ක් වූ මුළු වෙන්කිරීම් උපයෝජනය කර නොතිබුණි.

(iv) තොටුපොළ නඩත්තු කාර්යයන් සඳහා සලසන ලද වෙන්කිරීම් උපයෝජනය සම්බන්ධයෙන් ප්‍රගතිය ඉතාම අඩු මට්ටමක විය.

(v) අධිකාරියේ සැලසුම් අංශයට ප්‍රවාහන සංඥා පහන් නඩත්තුව සඳහා කිසිදු වෙන්කිරීමක් කර නොතිබුණද එම අංශය විසින් රු. මිලියන 13 ක මුදලක් වැය කර තිබුණි.

**(ආ) මාර්ග නඩත්තු කිරීම, පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම**

**-------------------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාර්ග නඩත්තු කිරීම සඳහා මුළු වෙන්කිරීමට අමතරව, හොරණ, විධායක ඉංජිනේරු කාර්යාලයේ විෂය පථය යටතේ ප්‍රදේශයේ විදුලි පහන්/ සංඥා පහන්/ මාර්ග සලකුණු කිරීම හා සවිකිරීම් නඩත්තුව සඳහා අධිකාරිය විසින් රු. මිලියන 32.50 ක තවදුරටත් වෙන්කිරීමක් කර තිබුණි. කෙසේ වුවද විධායක ඉංජිනේරු කාර්යාලය විසින් ප්‍රතිපාදනයෙන් සියයට 39.36 ක් නියෝජනය වන රු. මිලියන 12.79 ක වියදමක් පමණක් ප්‍රදේශයේ යහපත් මාර්ග ආරක්ෂණ තත්ත්වයක් තහවුරු කිරීමට හැකිවනු පිණිස 2012 වර්ෂයේදී මෙම කාර්යය සඳහා දරා තිබුණි.

(ii) 2012 වර්ෂය තුළදී අගලවත්ත, විධායක ඉංජිනේරු කාර්යාලය විසින් සිදු කරන ලද ප්‍රතිසංස්කරණ වැඩ හතරක් වෙනුවෙන් වැය කරන ලද රු.2,458,151 ක මුදලක් 2012 වර්ෂය සඳහා අධිකාරියේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(iii) රත්නපුර හා කෑගල්ල පළාත් කාර්යාල විසින් සිදුකරන ලද මාර්ග පුළුල් කිරීම් හා වැඩිදියුණු කිරීම් වැඩ 33 ක් 2012 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණු අතර, 2012 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ මාර්ග නඩත්තු කාර්යයන් 33 ක් ඉහත කාර්යාල මගින් සිදු කර නොතිබුණි.

(iv) හදිසි වැඩ ලෙස හඳුනාගත් වැඩ 11ක් සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර නොතිබූ අතර රු.26,824,774 ක මුදලක් වැය කරමින් වෙනත් වැඩ 6 ක් සම්පූර්ණ කර තිබුණි.

**(ඇ) පාලම්, ගුවන්පාලම් ඉදිකිරීම සහ හානි වූ අබලන් පාලම් ප්‍රතිසංස්කරණය කිරීම (පාලම් සැලසුම් / ග්‍රාමීය පාලම්)**

2012 වර්ෂය සඳහා පාලම් හා ගුවන්පාලම් ඉදිකිරීම පිළිබඳ අධිකාරියේ වෙන්කිරීම් හා තථ්‍ය වියදම පහත පරිදි වේ.

| **විස්තරය** | **වර්ෂය සඳහා වෙන්කිරීම** | **තථ්‍ය වියදම** | **උපයෝජනය වෙන්කිරීමේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|
| | **රු. මිලියන** | **රු. මිලියන** | |
| හානි වූ හෝ අබලන් පාලම් ප්‍රතිසංස්කරණය කිරීම - අවිච්ඡින්න වැඩ | 573.3 | 629.5 | 109.8 |
| හානි වූ හෝ අබලන් පාලම් ප්‍රතිසංස්කරණය කිරීම- නව වැඩ | 126.7 | 4.4 | 3.5 |
| ග්‍රාමීය පාලම් ඉදිකිරීම | 100 | 78.6 | 78.6 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 වර්ෂය තුළදී හානි වූ පාලම් ප්‍රතිසංස්කරණය සඳහා පළාත් කාර්යාල 9 කට වෙන් කරන ලද මුදල රු. මිලියන 573.3 ක් වූ අතර රු. මිලියන 629.5 ක මුදලක් වැය කර තිබුණි. මධ්‍යම, උතුර, වයඹ හා සබරගමුව පළාත් කාර්යාල විසින් ඉදිකිරීම් වැඩ යටතේ හානි වූ හෝ අබලන් පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කරන ලද ඒවායේ වාර්ෂික වෙන්කිරීම් ඉක්මවා තිබුණි.

(ii) පළාත් කාර්යාල 10 ක පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සිදු කළ යුතු ව්‍යාපෘති 47 ක් හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් නොකරන ලද ව්‍යාපෘති 6 ක් ක්‍රියාත්මක කර තිබූ අතර ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කරන ලද ව්‍යාපෘති 4 ක් 2012 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි.

(iii) මධ්‍යම, උතුර හා වයඹ පළාත් කාර්යාල තුන විසින් නව වැඩ යටතේ පළාත් පහක හානිවූ හෝ අබලන්වූ පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සලසන ලද වෙන්කිරීම් සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබුණි.

(iv) පළාත් පහක හානි වූ හෝ අබලන් පාලම් 71 ක් හඳුනාගෙන තිබුණද 2012 දෙසැම්බර් 31 දක්වා පාලම් 59 කට අදාළ කාර්යයන් ආරම්භ කර නොතිබුණි.

(v) ග්‍රාමීය පාලම් ඉදිකිරීම යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනා ගන්නා ලද ව්‍යාපෘති 31 කින් ව්‍යාපෘති 6 ක් ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි. තවද, ග්‍රාමීය පාලම් 13 ක ඉදිකිරීම් වැඩ 2012 වර්ෂය තුළදී ආරම්භ කර නොතිබුණි.

**(ඈ) මාර්ග පුළුල් කිරීම් හා වැඩි දියුණු කිරීම්**

---------------------------------------------

2012 වර්ෂය සඳහා අධිකාරියේ ක්‍රියාකාරි සැලැස්ම අනුව, දිස්ත්‍රික්ක 25 ක මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා රු. මිලියන 5,400 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබූ අතර කාර්ය සාධන වාර්තාව අනුව, රු. මිලියන 11,932 ක මුදලක් උපයෝජනය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික්ක 16 ක කාර්යාල විසින් මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම් කාර්යයන් සඳහා සලසන ලද වෙන්කිරීම් ඉක්මවා තිබුණු අතර, මුලතිව්, මඩකලපුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල සැලසුම් කරන ලද කාර්යයන්

2012 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි. ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් කර නොතිබූ කාර්යයන් 289 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ පිරිවැය රු. මිලියන 4,821 ක් විය.

(ii) වාර්ෂික වැඩ සැලැස්ම අනුව, මාර්ග පුළුල් කිරීම හා වැඩි දියුණු කිරීම් වැඩ 593 ක් හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද වැඩ සැලැස්මේ හඳුනා ගෙන නොතිබූ වැඩ 289 ක් සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 4,821 ක පිරිවැයකට සිදු කර තිබුණි.

**3.1.2 අධිකාරියේ වාණිජ කටයුතු**

**(අ) "ඉන්ටර්ලොක් කොන්ක්‍රීට් ඇතුරුම් ගල්" නිෂ්පාදනය කිරීම**

"ඉන්ටර් ලොක් ඇතුරුම්ගල් " යන්ත්‍ර 54 ක් මිලදී ගැනීමට රු. මිලියන 52 ක මුදලක් අධිකාරියේ පළාත් අධ්‍යක්ෂවරුන්ට මුදාහැර තිබුණි. ඒ අනුව යන්ත්‍ර 54 ක් මිලදී ගෙන තිබූ අතර විධායක ඉංජිනේරුවරුන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමුද්‍රව්‍ය නොමැතිවීම, ඉල්ලුම ප්‍රමාණවත් නොවීම, සහ විකුණුම් මිලට වඩා නිෂ්පාදන පිරිවැය වැඩිවීම හේතුවෙන් විධායක ඉංජිනේරු කාර්යාලවල ස්ථානගත යන්ත්‍ර 38 ක් 2012 දෙසැම්බර් 31 දින දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) විධායක ඉංජිනේරු කාර්යාලවලින් ලබාගත් තොරතුරු අනුව, 2012 වර්ෂය තුළදී කිසිදු ඉල්ලුමක් නොමැතිව ඇතුරුම් ගල් 100,162 ක සංඛ්‍යාවක් ඉතිරි තොගය ලෙස පැවතුණි.

**(ආ) "පෙරමුසු" නිෂ්පාදනය කිරීමේ පිරියත**

බලන්ගොඩ පෙරමුසු නිෂ්පාදනය කිරීමේ පිරියතෙහි නිෂ්පාදන ක්‍රියාවලිය 2012 ජුලි 16 දින ආරම්භ කර තිබුණු අතර, මතුපිට පෙරමුසු මිශ්‍රණයේ මෙට්‍රික් ටොන් 1342 ක් හා බැඳුම් මිශ්‍රණයේ මෙට්‍රික් ටොන් 6103 ක් සහ "කට් බැක්ස්" මෙට්රික් ටොන් 5587 ක් එදින සිට 2013 ජුලි දක්වා නිෂ්පාදනය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙහෙයුම් ආරම්භ කිරීමට පෙර රු. 423,200 ක් වටිනා ඩීසල් ලීටර් 3680 ක් යොදා ගෙන තිබුණි. මෙම ඩීසල් උපයෝජනය පිළිබඳව හේතු වූ කරුණු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ii) පෙරමුසු නිෂ්පාදනය (නිමැවුම) හා 2012 වර්ෂය තුළ හා 2013 ජුලි 16 දක්වා ඩීසල් හා භූමිතෙල් නිකුත් කරන ලද ප්‍රමාණයන් (යෙදවුම් )සම්බන්ධයෙන් පිරියතෙහි පවත්වා තිබූ වාර්තාවලට අනුව, ඩීසල් හා භූමිතෙල් අසාමාන්‍ය ප්‍රමාණයන් නිෂ්පාදනය සඳහා නිකුත් කර තිබූ බව විගණනයේදී අනාවරණය විය. එබැවින්, පෙරමුසු මෙට්‍රික් ටොන් එකක් නිෂ්පාදනය සඳහා සාමාන්‍ය ඩීසල් පරිභෝජනය ලීටර් 7 සිට ලීටර් 74 දක්වා පරාසයක වූ අතර “කට්බැක්” මෙට්‍රික් ටොන් එකක් නිෂ්පාදනය සඳහා භූමිතෙල් පරිභෝජනය ලීටර් 7 සිට ලීටර් 17 දක්වා පරාසයක විය. එහෙත් පෙරමුසු හා "කට්බැක් " මෙට්‍රික් ටොන් එකක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ඩීසල් හා භූමිතෙල් පිළිවෙලින් ලීටර් 9 ක් හා ලීටර් 5 ක ප්‍රමාණයක් වේ.

(iii) පිරියතෙහි මෙහෙයුම් වෙනුවෙන් විදුලිබල උත්පාදනය සඳහා විදුලි බල උත්පාදන යන්ත්‍රයක් යොදාගෙන තිබූ අතර එම යන්ත්‍රයේ මෙහෙයුම් සඳහා ඩීසල් අවශ්‍යතාවය පැයකට ලීටර් 33 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වුවද, නිෂ්පාදන වාර්තා සහ ඩීසල් නිකුත් කිරීම් එක් පැයක මෙහෙයුම් සඳහා ලීටර් 15 සිට ලීටර් 1386 දක්වා ප්‍රමාණයක් වූ අතාත්වික ඩීසල් උපයෝජනයක් දක්වා තිබුණි.

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**-------------------------------**

2008 අගෝස්තු 14 දින පවත්වන ලද රැස්වීමේදී අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය පදනම් කරගෙන මාර්ග පුනරුත්ථාපනය සහ ප්‍රිමික්ස්, පැවින් ද්‍රව්‍ය හා ඉමල්ෂන් ආදි ද්‍රව්‍ය ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් පුද්ගලික සමාගම් තුනක් සමග අධිකාරිය විසින් සැලකිය යුතු සංඛ්‍යාවක ගනුදෙනු සිදු කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව, මාර්ග පුළුල් කිරීම, ප්‍රතිසංස්කරණය හා නඩත්තු කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රු.මිලියන 23,822 ක මුදලක් වැය කර තිබුණු අතර ඉහත

එක් සමාගමක් විසින් මාර්ග පුළුල් කිරීමේ ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත් සිදු කර තිබූ බව විගණනයේදී අනාවරණය විය. කෙසේ වුවද වර්ෂය අවසානයට ප්‍රාදේශීය මට්ටමින් වැඩ නිම කිරීමේ භෞතික ප්‍රගතිය සම්බන්ධයෙන් තොරතුරු අධිකාරියෙහි නොතිබුණි.

(ii) ඉහත සඳහන් සමාගම්වලට පවරන ලද ඉදිකිරීම් හා උපදේශක සේවා පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iii) එක් සමාගමක් සමග ගනුදෙනු මත ලැබිය යුතු ලෙස අධිකාරියේ ලෙජර් ගිණුම් 4 ක දැක්වෙන එකතුව රු.1,236,424,625 ක ශේෂ අදාළ සමාගම විසින් රු.1,685,544,068 ක් ලෙස සෘජුවම තහවුරු කර තිබුණු අතර නිරීක්ෂණය වූ රු.449,119,443 ක වෙනස පිළිබඳව පැහැදිලි කර නොතිබුණි.

(iv) ඉහත සමාගම් දෙක සමඟ ගනුදෙනු මත ගෙවිය යුතු ලෙස අධිකාරියේ ලෙජර් ගිණුම් තුනක දැක්වෙන එකතුව රු.44,189,194 ක ශේෂ අදාළ සමාගම් විසින් රු.3,185,346,898 ක් ලෙස සෘජුවම තහවුරු කර තිබුණු අතර නිරීක්ෂණය වූ රු.3,141,157,704 ක වෙනස පිළිබඳව පැහැදිලි කර නොතිබුණි.

(v) ඉහත එක් සමාගමක් සමග ගනුදෙනුවලට අදාළව ගෙවිය යුතු ලෙස අධිකාරියේ ලෙජර් ගිණුම්වල දැක්වෙන එකතුව රු.35,429,053 ක ශේෂ අදාළ සමාගම විසින් රු.51,291,044 ක් ලෙස සෘජුවම තහවුරු කර තිබුණු අතර නිරීක්ෂණය වූ රු.15,861,991 ක් වූ වෙනස පැහැදිලි කර නොතිබුණි.

(vi) ඉහත සමාගම් දෙකක් සමග ගනුදෙනු සම්බන්ධයෙන් ලැබිය යුතු ලෙස අධිකාරියේ ලෙජර් ගිණුම්වල දැක්වෙන ශේෂ අදාළ සමාගම් විසින් තහවුරු කර නොතිබුණි.

(vii) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 3 පරිච්ඡේදය ප්‍රකාරව, ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව අධිකාරිය විසින් ඇතැම් කොන්ත්‍රාත්තු ඉහත සමාගම්වලට සෘජුවම ප්‍රදානය කර තිබූ බව නිරීක්ෂණය විය. ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව ඉහත සමාගම්වලට කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම සඳහා 2013 පෙබරවාරි 04 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබාගත් බව අධිකාරියේ සභාපති විසින් දන්වා තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

### 3.3.1 මාර්ග පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම

**(අ) දේශීය බැංකු මූල්‍යයන මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය (LBFRRP)**

2011 පෙබරවාරි 09 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තීරණය කරන ලද පරිදි දිවයින පුරා කිලෝමීටර් 600 ක් දිග ප්‍රමාණයක ප්‍රමුඛත්ව මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා දේශීය බැංකුවලින් එජඩො මිලියන 500 ක (රු.මිලියන 55,915 කට සමාන) ණය මුදල් ලබා ගැනීමට අධිකාරියට අනුමැතිය දී තිබුණි. එබැවින් කිලෝමීටර් 543.36 ක මුළු දිග සහිත මාර්ග 19 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත් වටිනාකම රු.50,319,762,550 ක් වූ ණය දේශීය බැංකු විසින් 2013 ජුනි 30 දින වන විට ලබාදී තිබුණි. 2011 පෙබරවාරි 09 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, මාර්ග ඉදිකිරීම් සඳහා සී 1 ශ්‍රේණිය යටතේ ඉදිකිරීම්, පුහුණු හා සංවර්ධන ආයතනයෙහි ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, පුනරුත්ථාපන කාර්යයන් සඳහා අධිකාරිය විසින් තෝරාගත් මාර්ගවලට තාක්ෂණික හා මූල්‍ය යෝජනා පිළියෙල කිරීමට අනුමැතිය දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බැංකුවලින් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ශුද්ධ මුදල ඉක්මවා රු.49,308,245 ක මුදලක් අධිකාරිය විසින් ආපසු ලබාගෙන එම අතිරික්ත මුදල්, රඳවා ගැනීම් මුදල් සහ ඉදිකිරීම් කර්මාන්ත ප්‍රදාන අරමුදල් ගාස්තු ගෙවීම් සඳහා යොදාගෙන තිබුණි. එබැවින් අතිරික්ත ආපසු ගැනීම් සඳහාද අධිකාරිය විසින් පොලී ගෙවා තිබුණි.

(ii) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ පරිදි, අධිකාරිය විසින් තෝරාගෙන තිබුණු කොන්ත්‍රාත්කරුවන් සඳහා අධිකාරිය විසින්ම තෝරා ගනු ලැබූ මාර්ග වෙන් කර තිබුණු අතර අදාළ මාර්ග සඳහා තරඟකාරී ලංසු කැඳවා තිබුණි. අධිකාරිය සමඟ කොන්ත්‍රාත්කරුවන් එකඟ වූ කිලෝමීටරයකට යෝජිත සාමාන්‍ය මිල ඉතා ඉහළ බව නිරීක්ෂණය වූ අතර එය මාර්ගයෙන් මාර්ගයට වෙනස් විය. තවද මිල සැඳහුම්වල සියයට 35 ක ලාභාන්තිකයක් ද ඇතුළත් කර තිබුණු නමුත්, මහාමාර්ග රේටයන් පිළිබඳ උපලේඛනයේ (Highway Schedule of Rates) දක්වා ඇති පරිදි පිරිවැය ඇස්තමේන්තු ගණනය කිරීමේදී රේටයන් ඇතුළත් කිරීමට අනුමැතිය දී නොතිබුණි.

**(ආ) කෑගල්ල අතුරු මාර්ගය (කිලෝමීටර් 2.06)**

කෑගල්ල නගරයේ ප්‍රවාහන තදබදය මඟ හරවා ගැනීමේ අරමුණ සහිතව 2008 වර්ෂයේදී අදියර දෙකක ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණද 2012 දෙසැම්බර් 31 වන විටත් නිම කර නොතිබුණි. පාලන පද්ධතියේ පහත දැක්වෙන දුර්වලතා හේතුවෙන් වැඩ පිළිබඳ කාර්ය සාධනය අසතුටුදායකව පැවතුණි.

(i) සෘජු ශ්‍රම පදනම යටතේ රු. මිලියන 81.61 ක ඇස්තමේන්තුවකට අදියර -01 වැඩ 2008 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර පසුව රු.මිලියන 169.73 ක පිරිවැයකට මගනැගුම මාර්ග ඉදිකිරීම් සමාගමට භාරදී තිබුණි. අදියර - 02 වැඩද සෘජු ශ්‍රම පදනම යටතේ රු.මිලියන 35.79 ක පිරිවැයකට 2010 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. කෙසේ වුවද වැඩවල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් 2011 නොවැම්බර් මාසයේදී වෙනම ව්‍යාපෘති කාර්යාලයක් ස්ථාපිත කර තිබුණි.

(ii) කෑගල්ල - ප්‍රධාන ව්‍යාපෘති ඉංජිනේරු කාර්යාලය විසින් සෘජු ශ්‍රම පදනම මත නිම කළ වැඩ සඳහා වෙනම ලෙජරයක් පවත්වා නොතිබුණි. එබැවින් ව්‍යාපෘති කාර්යාලය විසින් දරන ලද රු.403,915,173 ක්වූ මුළු වියදම් සම්බන්ධයෙන් විස්තර විගණනයට ලබා ගත නොහැකි විය.

(iii) ව්‍යාපෘති කාර්යාලය විසින් කාර්යයන් කොටස්වලට වෙන් කිරීමට කටයුතු කර තිබූ අතර රු.මිලියන 3 ක අනුමත සීමාව තුළ ගෙවීමට හැකිවන පරිදි කොන්ත්‍රාත්කරුවන්ට අධිකාරිය විසින් එම කාර්යයන් ලබා දී තිබුණි. කෙසේ වුවද වෙන්කරන ලද වැඩ එකම කොන්ත්‍රාත්කරුට ලබාදීම නිරීක්ෂණය විය.

(iv) රු.131,807,232 ක් වටිනාකම වූ ප්‍රසම්පාදන, ලියාපදිංචි නොවූ සැපයුම්කරුවකු වෙතින් සිදුකර තිබූ බව නිරීක්ෂණය විය.

**(ඇ) තණකොළවත්ත පාලම - කෑගල්ල දිස්ත්‍රික්කය - ( ග්‍රාමීය පාලම් අංශය )**

පාලමේ ඉදිකිරීම් වැඩ 2011 ජුලි 27 වන විට නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද රු.22,557,650 ක් වටිනා වැඩ 2013 පෙබරවාරි 13 වන විටත් නිම කර නොතිබුණි. සභාපති විසින් පහත පරිදි පිළිතුරු සපයා තිබුණි. "ද්‍රව්‍ය හා යන්ත්‍ර වැඩ බිමට ප්‍රවාහනයේදී කොන්ත්‍රාත්කරුට ප්‍රවාහන දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවීමෙන්

ප්‍රමාදයන් ඇති විය. කෙසේ වුවද කොන්ත්‍රාත්කරු විසින් වැඩ අඛණ්ඩව සිදු කර ගෙන යනු ලැබේ.”

**(ඇ) වේයන්ගොඩ - රුවන්වැල්ල මාර්ගයේ පාලම් අංක 33/1**

ඉහත පාලම ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව රු.74,171,053 ක පිරිවැයකට රාජ්‍ය සංස්ථාවකට ප්‍රදානය කර තිබුණි. කාලය දීර්ඝ කිරීම් 4 ක් අනුමත කර තිබුණද, 2012 දෙසැම්බර් 31 වන විටත් වැඩ නිම කර නොතිබුණි. කෙසේ වුවද ගෙවිය හැකි උපරිම දීමනාව ඉක්මවමින් රු. 3,500,030 ක මුදලක් මිල ඉහළ යාම හේතුවෙන් ගෙවා තිබුණි.

**(ඉ) දෙහිඕවිට - දැරණියගල - නූරිය මාර්ගයේ උරුපෙල්ලව එල්ලෙන පාලම**

අවලම්බන පාලම සඳහා උප ව්‍යුහය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.1,715,377 ක මිලකට කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද ප්‍රධාන ව්‍යුහයේ වැඩ 2013 පෙබරවාරි 13 වන විටත් සම්පූර්ණ කර නොතිබුණි.

**(ඊ) මීරිස්වත්ත- වතුරුගම මාර්ගය (ගම්පහ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය)**

රු.36,734,093 ක පිරිවැයකට මීරිස්වත්ත - වතුරුගම මාර්ගය (කි.මී. 0+000 සිට කි.මී.5+000) පුනරුත්ථාපනය හා ප්‍රතිසංස්කරණය 2011 සැප්තැම්බර් 15 දින පුද්ගලික කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැඩ පූර්ව අත්තිකාරම් මුදා හැරීමේදී, ඉඩම් අත්පත් කර ගැනීමේදී ආරවුල් හා පවත්නා උප ව්‍යුහයන් ඉවත් කිරීමේදී ප්‍රමාදයන් හේතුවෙන් වැඩ ආරම්භ කිරීම කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාද කර තිබුණි. 2013 මැයි 15 දින කොන්ත්‍රාත්කරු වැඩ අත්හැර දමා තිබූ අතර රු.2,046,982 ක ගෙවා තිබූ අත්තිකාරම් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ii) ඉඩම් අත්කර ගැනීමේ කාර්යයන් 2012 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. අත්කර ගත් ඉඩම්වලට වන්දි ගෙවීම සඳහා අධිකාරිය විසින් මහර ප්‍රාදේශීය ලේකම්ට රු.4,803,000 ක මුදලක් 2011 වර්ෂයේ සැප්තැම්බර් මස ප්‍රේෂණය කර තිබූ නමුත් අරමුණු කළ කාර්යයන් සඳහා

උපයෝජනය කිරීමෙන් තොරව 2013 අගෝස්තු 31 වන විටත් මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පතු ගිණුමේ පැවතුණි.

**(උ) මග නැගුම සංවර්ධන වැඩ සටහන් (පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, සබරගමුව)**

රු.22,000,000 කට "බ්ලොක් පේවින්" මාර්ග ඉදිකිරීම් වැඩ 35 ක් 2012 වර්ෂය සඳහා සැලසුම් කර තිබුණි. මෙයින් වැඩ 08 ක් පමණක් 2012 දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණි. තවද වැඩ 12 ක් ප්‍රගතියේ පැවති අතර වැඩ 15 ක් ආරම්භ කර නොතිබුණි. එවැනි "බ්ලොක් පේවින්"/කොන්ක්‍රීට් වැඩ කිහිපයක් මග නැගුම මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගමට පවරා තිබුණි. 2012 දෙසැම්බර් 12 දින සිදුකරන ලද රු.107,280,376 ක් පිරිවැය වූ මාර්ග ඉදිකිරීම් වැඩ 06 ක් පිළිබඳ ක්ෂේත්‍ර විගණන පරීක්ෂණවලදී එම වැඩ අඩු ප්‍රමිතියකින් සිදුකිරීම හේතුවෙන් මාර්ග මතුපිට පිපිරීම් කිහිපයක් වර්ධනය වෙමින් තිබුණු බව අනාවරණය විය.

**(ඌ) හොරණ - අඟුරුවාතොට - අළුත්ගම මාර්ගය (විධායක ඉංජිනේරු කාර්යාලය, හොරණ)**

හොරණ - අඟුරුවාතොට - අළුත්ගම මාර්ගයේ අංශ දෙකක පෙරමුසු ඇතිරීම සඳහා කොන්ත්‍රාත්තු, දක්ෂිණ අධිවේගී මාර්ගය විවෘත කිරීමේ අරමුණින් හදිසි පදනමක් යටතේ කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට ප්‍රදානය කර තිබුණි. මාර්ගයේ කි.මී. 42 + 300 සිට කි.මී. 44+600 දක්වා කොටස සඳහා පෙරමුසු ඇතිරීමේ කොන්ත්‍රාත්තුව වැට් නොමැතිව රු. 31,097,750 ක ලංසු මිලකට ප්‍රදානය කර තිබුණි. අදාළ ලංසු වටිනාකම ඉංජිනේරු ඇස්තමේන්තුව සියයට 19 කින් ඉක්මවා තිබුණි. කි.මී. 45+000 සිට කි.මී. 47+000 දක්වා කොටසේ පෙරමුසු ඇතිරීම සඳහා කොන්ත්‍රාත්තුව වැට් නොමැතිව රු.26,335,320 ක ලංසු මිලකට ප්‍රදානය කර තිබුණි. ලංසු වටිනාකම සියයට 10 කින් ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පෙරමුසු ඇතිරීමේ වැඩ කොන්ත්‍රාත්කරු විසින් 2011 නොවැම්බර් 24 දින ආරම්භ කර තිබූ අතර දින තුනක් ඇතුළත 2011 නොවැම්බර් 26 දින නිම කර තිබුණි. කෙසේ වුවද ඉදිකිරීම් ලිපිගොනුවෙන් ලබාගත් තොරතුරුවලට අනුව, කොන්ත්‍රාත්කරු විසින් ඔහුගේ ලංසු 2011 නොවැම්බර් 19 දින ඉදිරිපත් කර තිබුණි. එබැවින් ඇතිරීම් වැඩ නිම කිරීමෙන් පසුව සාමාන්‍ය ලංසු පරිපාටිය අනුගමනය කර තිබුණි.

(ii) ඉමල්ෂන් යොදාගනිමින් මංතීරු ආලේපය සඳහා සිදුකරන ලද මිනුම් අනුව, කි.මි. 42+300 සිට කි.මි. 44+600 ක මාර්ග කොටස සඳහා පෙරමුසු ඇතිරීමේ වැඩ සඳහා මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 12,949.23 ක් විය. පෙරමුසු ඇතිරීම් සඳහා මි.මි. 50 සම්මත ඝනකම සැලකීමේදී, ඝන මීටරයකට අවශ්‍ය පෙරමුසු ප්‍රිමික්ස් ප්‍රමාණය (එනම් metric ton. 2.35 per cu.m. ) මෙට්‍රික් ටොන් 1521.53 ක් (12,949.23 x 0.05 x 2.35) විය යුතුය. කෙසේ වුවද කොන්ත්‍රාත්කරුට මෙට්‍රික් ටොන් 1,865 කට ගෙවා තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මෙට්‍රික් ටොන් 343.47 ක් සඳහා රු. 5,323,785 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. තවද, අධිකාරිය විසින් තථ්‍ය මිනුම් පදනම් කරගෙන නොව වාහන පැටවීම් සංඛ්‍යාව පදනම් කරගෙන පෙරමුසු බැඳීම් ස්ථරය සඳහා ගෙවීම් කර තිබුණු බව නිරීක්ෂණය විය.

(iii) ඉමල්ෂන් යොදාගනිමින් මං තීරු ආලේපය සඳහා සිදු කරන ලද මිනුම් අනුව, කි.මි. 45+000 සිට කි.මි. 47+000 දක්වා කොටසේ මාර්ග දිග හා මාර්ග පළල මැන තිබුණු අතර පෙරමුසු ඇතිරීම සඳහා මුළු ප්‍රමාණය වර්ග මීටර් 5,124.3 ක් විය. පෙරමුසු ඇතිරීම සඳහා මි.මි. 50 සම්මත ඝනකම සැලකීමේදී ඉහත මාර්ග කොටස සඳහා ඝන මීටරයකට අවශ්‍ය පෙරමුසු ප්‍රිමික්ස් ප්‍රමාණය (එනම් ඝන මීටරයකට මෙට්‍රික් ටොන් 2.35) මෙට්‍රික් ටොන් 602.10 ක් (5,124.30 x 0.05x 2.35) විය යුතුය. කෙසේ වුවද ඒ සඳහා කොන්ත්‍රාත්කරුට සිදුකරන ලද තථ්‍ය ගෙවීම් මෙට්‍රික් ටොන් 680.25 ක් සඳහා වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස රු.1,067,529 ක මුදලක් මෙට්‍රික් ටොන් 8.15 ක් සඳහා කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි. තවද අධිකාරිය විසින් පෙරමුසු බැඳීම් ස්ථරය සඳහා ගෙවීම් කර තිබූ අතර එය තථ්‍ය මිනුම් පදනම් කරගෙන නොව වාහනවලට පැටවීම් සංඛ්‍යාව මත පදනම් වී තිබුණු බව නිරීක්ෂණය විය.

**(එ) හෝලි ක්‍රොස් වටරවුම සංවර්ධනය (ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය, කළුතර)**

---

කළුතර හෝලි ක්‍රොස් විද්‍යාල මංසන්ධියේ වටරවුම සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව 2011 මැයි 09 දින රු.මිලියන 8.34 ක ඇස්තමේන්තුගත පිරිවැයකට පුද්ගලික කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කර තිබුණි. වටරවුම සංවර්ධනය සඳහා වු ප්‍රමාණ පත්‍රවල දක්වා තිබූ පරිදි රු.12,541,605 ක් වටිනා ‘‘ගාඩ් රේල්ස්’’ දික් මීටර් 1,500 ක් කොන්ත්‍රාත්කරු විසින් සපයා තිබුණි. කෙසේ වුවද, ‘‘ගාඩ් රේල්ස්’’ තථ්‍ය

අවශ්‍යතාවය ප්‍රමාණ පත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා ඉතා අඩු වූ දික් මීටර් 373.5 ක් පමණක් විය. එබැවින් රු.6,726,506 ක් වටිනා "ගාඩ් රේල්ස්" දික් මීටර් 807.5 ක් ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය විසින් වෙනත් විවිධ කාර්යයන් සඳහා යොදාගෙන තිබූ අතර රු.2,574,990 ක් වටිනා "ගාඩ් රේල්ස්" දික් මීටර් 306 ක ඉතිරි ප්‍රමාණය කාර්යාල පරිශ්‍රයේ අනාරක්ෂිතව තබා තිබුණි.

**(ඒ) පානදුර නගරයේ බස් නැවතුම් පොළ මංසන්ධිය සංවර්ධනය කිරීම**

රු. මිලියන 45.5 ක වටිනාකමට පානදුර නගරයේ බස් නැවතුම්පොළ මංසන්ධිය සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව 2011 ඔක්තෝබර් 17 දින ආරම්භ කර 2012 ජනවාරි 17 ට පෙර සම්පූර්ණ කිරීමට අපේක්ෂා කර තිබුණි. රු. මිලියන 4.53 ක්වූ වැඩ පූර්ව අත්තිකාරමක් 2011 දෙසැම්බර් 19 දින ලබාදී තිබුණි. කෙසේ වුවද වැඩ ආරම්භ කර නොතිබූ අතර කොන්ත්‍රාත්තුව 2012 දෙසැම්බර් 31 දින අවලංගු කර තිබුණි. වැඩ පූර්ව අත්තිකාරම් 2013 ජුනි 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

අදාළ කාර්යය ලෝක බැංකු ව්‍යාපෘතියක් යටතේ ක්‍රියාත්මක කරවීම සඳහා හඳුනාගෙන ඇති බැවින්, කොන්ත්‍රාත්තුව අවලංගු කළ බවත් කොන්ත්‍රාත්කරුගෙන් වැඩ පූර්ව අත්තිකාරම අය කර ගැනීමට කටයුතු කරනු ලබන බවත් අධිකාරියේ සභාපති විසින් දක්වා තිබුණි.

**(ඔ) දක්ෂිණ අධිවේගී මාර්ගයේ විවේක ප්‍රදේශයේ මාර්ග පුනරුත්ථාපන වැඩ (විධායක ඉංජිනේරු කාර්යාලය - අගලවත්ත)**

මෙම කාර්යය සඳහා ඇස්තමේන්තුගත වටිනකාම රු. 24,170,198 ක්වූ අතර, දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ විවේක ප්‍රදේශ සහ අභ්‍යන්තර මාර්ගවල පෙරමුසු ඇතිරීම, ඉන්ධන ස්ථානය සඳහා පස් කපා ඉවත් කිරීම, ප්‍රවේශ මාර්ගවල පෙරමුසු ඇතිරීම සහ මීටර් 0.6 ක විෂ්කම්භය වූ ප්‍රතිසාධන කොන්ක්‍රීට් (Reinforcement Concrete) නල බෝක්කු 2 ක් ඉදිකිරීම ආදි ප්‍රධාන කාර්යයන් සතරක් එයට අයත් විය. විධායක ඉංජිනේරු කාර්යාලය විසින් මෙම කාර්යයන් සෘජු ශ්‍රම පදනම මත රු.17,739,681 ක පිරිවැයකට සම්පූර්ණ කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මේ සඳහා දරන ලද පිරිවැය දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුගෙන් හෝ විවේක ප්‍රදේශය මෙහෙයුම් කරන බදුකරුගෙන් (ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ) අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව මාර්ග නඩත්තු කිරීමේ පිරිවැය ලෙස සලකා තිබුණි.

(ii) දක්ෂිණ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ විවේක ප්‍රදේශය විවෘත කිරීම් අවස්ථාවේදී විවේක ප්‍රදේශයට ප්‍රවේශවීම සඳහා "රබර් එස්ටේට් සර්කියුලර් රෝඩ්" නම් වූ අතිරේක මාර්ගයකට රු.2,666,443 ක පිරිවැයකට අගලවත්ත විධායක ඉංජිනේරු කාර්යාලය විසින් පෙරමුසු අතුරා තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද මීටර් 420 ක් දිග වූ මෙම මාර්ගය දැනට සාමාන්‍ය මහජනතාව විසින් භාවිතා කරනු නොලැබේ.

## 3.4 මතභේදයට තුඩුදෙන කරුණු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

### (අ) අධිවේගී මාර්ග කළමනාකරණ ඒකකය

අධිවේගී මාර්ගයේ මෙහෙයුම් සඳහා අනුයුක්ත පොලිස් දෙපාර්තමේන්තුවේ ඒකකයට අදාළව පරිපාලන වියදම් යටතේ වර්ෂය තුළදී රු.40,201,167 ක මුදලක් වැය කර තිබුණි. කෙසේ වුවද පොලිස් දෙපාර්තමේන්තුව විසින් සපයන ලද සේවා ස්වභාවය හා අධිකාරිය විසින් දැරිය යුතු පිරිවැය ආදී විසඳිය යුතු කරුණු සඳහා අධිකාරිය විසින් පොලිස් දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.

### (ආ) බදු ඉඩම් සඳහා රාජ්‍ය ඉඩම් මාරු කිරීම්

(i) මහා මාර්ග දෙපාර්තමේන්තුවෙන් පවරාගන්නා ලද නාරාහේන්පිට පිහිටි පර්චස් 77 ක රජයට අයත් ඉඩම, ආගමික ආයතනයකට ඔවුන්ගේ කාර්යයන් සඳහා යොදා ගැනීමට 2007 වර්ෂයේ සිට අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද ඉඩමේ නීත්‍යානුකූල අයිතිය 2013 ජුනි 30 වන විටත් ආයතනයට පවරා නොතිබුණි. තවද 2010 පෙබරවාරි 03 දිනැති අංක එස්පී/ආර්ඩී/02/10 දරන ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම් කොමසාරිස්ගේ අනුමැතියද ලබා ගෙන නොතිබුණි.

(ii) තවද ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි වෙනත් ඉඩමක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කල් බදු පදනම මත නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන තිබුණු අතර, නාරාහේන්පිට පිහිටි ඉහත සඳහන් ඉඩමට වන්දි සඳහා 2007 සිට 2010 දක්වා අවස්ථා තුනකදී ඉහත කී ආගමික ආයතනයට රු. මිලියන 50 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2009 නොවැම්බර් 19 දින ලබාදී තිබුණි. එබැවින් රජයට අයත් ඉඩමකට බදු ඉඩමක් මාරු කිරීමේ සාධාරණත්වය සහ බදු කාර්යයන් සඳහා අධිකාරිය විසින් දරන ලද රු. මිලියන 50 ක මුළු පිරිවැයෙන් කොටසක් වූ රු. මිලියන 30 ක් ප්‍රාග්ධනිත කිරීම විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

**(ඇ) රජය සතු ඉඩමකට බදු ඉඩමක් මාරු කිරීම**

**-------------------------------------------**

2009 නොවැම්බර් 19 දින අමාත්‍ය මණ්ඩලය ගන්නා ලද තීරණය අනුව, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි ඉඩම බදු ගැනීම මත නාගරික සංවර්ධන අධිකාරියට රු.1,000 ක වාර්ෂික බදු කුලියක් ගෙවිය යුතු විය. කෙසේ වුවද, 2008 අගෝස්තු 20 දින මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නාගරික සංවර්ධන අධිකාරිය සමඟ අත්සන් කරන ලද 2008 අගෝස්තු 27 දිනැති අංක 1432 දරන බදු කුලී ගිවිසුමේ විධිවිධාන අනුව, වර්ෂ 50 කට වැඩි කාලයක් සඳහා වාර්ෂික බදු කුලිය රු. මිලියන 6 කට තීරණය කර තිබුණි. අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලද වාර්ෂික බදු කුලී ගෙවීම අඩුකිරීමට හැකිවන පරිදි බදු ගිවිසුම සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

තවද, 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඒ සඳහා ප්‍රතිපාදන සලසා තිබුණද ආරම්භක ගෙවීම හැර බදු කුලී ගෙවා නොතිබුණි. බදු ගිවිසුමේ විධිවිධාන අනුව, හිඟ ශේෂයන් සඳහා දඩ මුදල් පනවනු ඇත. එබැවින් හිඟ බදු කුලී සඳහා එකතුව රු.12,546,572 ක දඩ මුදල් අයකරනු ඇත.

**3.5 නිශ්ඵල ගනුදෙනු**

**-------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ප්‍රතිසංස්කරණය සඳහා පාලම් සැලසුම් කිරීම**

**------------------------------------------------**

රු.1,657,380,806 ක පිරිවැයකට 2004 සිට 2008 කාල පරිච්ඡේදය තුළදී දිවයිනේ පාලම්වල ශක්‍යතා අධ්‍යයනයන් හා විස්තීර්ණ සැලසුම් ව්‍යාපෘතිය විසින් සම්පූර්ණ කර තිබුණි. කෙසේ වුවද ඉහත ව්‍යාපෘතිය විසින් 2011 සිට 2012 කාලය තුළදී

සැලසුම් කරන ලද පාලම් 18 ක් පාලම් සැලසුම් කිරීමේ අංශය විසින් නැවත සැලසුම් කර තිබුණි. දේශීය බැංකු මූල්‍යයන මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද ගලිගමුව - රුවන්වැල්ල මාර්ගයේ පාලම් සැලසුම් කිරීමේ හා ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.2,472,357,070 ක පිරිවැයකට පුද්ගලික කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද එකී මාර්ගයේ පාලම් සැලසුම් වැඩ අධිකාරියේ පාලම් සැලසුම් කිරීමේ අංශය විසින් සිදුකර තිබුණි.

**(ආ) පොලී සහිත ණය ගැනීම්**

දේශීය බැංකු මූල්‍යයන මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ බැංකු සමඟ එළඹි ණය ගිවිසුම්වල 8 වගන්තිය අනුව, කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු ශුද්ධ මුදලට සමාන මුදලක් අදාළ බැංකුවලින් ඉවත් කර ගත යුතුය. කෙසේ වුවද කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල් සඳහා රු.7,643,468 ක මුදලක් 2012 අප්‍රේල් මාසයේදී බැංකු වලින් වැඩිපුර ආපසු ලබාගෙන තිබූ අතර 2012 අගෝස්තු 09 දින අතිරේක මුදල බැංකුවට ආපසු ගෙවා තිබුණි.

**(ඇ) ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතියෙන් එකතු කළ අගය මත බදු අයකර ගැනීම**

2012 ජුලි 10 දිනැති අංක ඊපී/06/20/03/0360 දරන මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව, ප්‍රමුඛතා මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන සියලු කොන්ත්‍රාත්තු සියළු බදුවලින් නිදහස් වේ. කොන්ත්‍රාත්කරුගේ බිල්පත්වලින් රු.17,593,594 ක මුදලක් එකතු කළ අගය මත බදු ලෙස අඩුකරගෙන 2012 අප්‍රේල් 02 දින දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කර තිබූ බව නිරීක්ෂණය විය.

**3.6 හඳුනාගන්නා ලද පාඩු**

හිමිකම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය හෝ රක්ෂකගේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව අළුත්වැඩියා කිරීම හේතුවෙන් මෝටර් වාහන තුනකට සිදුවූ අනතුරු මත වන්දි හිමිකම් ඉල්ලා නොතිබුණි. තවත් වාහනයක් 2010 වර්ෂයේදී අනතුරකට භාජනයවී තිබූ අතර, එය අනුමැතිය නොමැති ගමනක් වීම හේතුවෙන් රක්ෂණ හිමිකම ප්‍රතික්ෂේප කර තිබුණි. පසුව වාහනය 2012 අප්‍රේල් මාසයේදී රු.1,147,680 ක පිරිවැයකට අළුත්වැඩියා කර තිබූ අතර අධිකාරියේ ආදායමට අයකර තිබුණි. අදාළ වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් හානිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.7 වත්කම් කළමනාකරණය

### (අ) වැඩ පොළ - අඟුලාන

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සියලු වර්ගයේ වාහන හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදු කිරීමට අඟුලාන ප්‍රදේශයේ සියලු උපකරණ සහිත වාහන නඩත්තු වැඩපොළක් අධිකාරිය සතුව තිබුණද, වාහන අළුත්වැඩියා සඳහා අධිකාරිය විසින් 2012 දෙසැම්බර් 31 දිනට රු.74,006,655 ක මුදලක් වැය කර තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරියේ වැඩපොළ භාවිතා කිරීමෙන් තොරව වාහන විශාල සංඛ්‍යාවක අළුත්වැඩියාවන් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බාහිර ගරාජ මගින් සිදුකර ගෙන තිබුණි.

(ii) අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලද අනුමැතියට අනුව, වැඩ පොළෙහි වාහන සේවා මධ්‍යස්ථානයේ කාර්යයන් 2011 නොවැම්බර් 02 සිට බලපැවැත්වෙන පරිදි ආරම්භ කර තිබුණි. එම පහසුකම් රජයේ ආයතන හා මග නැගුම සමාගම්වලට අයත් වාහනවලටද ලබාදීමට අපේක්ෂා කර තිබුණද, බස්නාහිර පළාතේ පිහිටි අධිකාරියේ කාර්යාලවල වාහන සේවා කිරීමට පමණක් මෙම පහසුකම් සීමාවී තිබුණි.

(iii) අළුත්වැඩියා නිම කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය. වැඩ පොළ භාර නිලධාරීන් විසින් සිදු කරන ලද පැහැදිලි කිරීම්වලට අනුව, යන්ත්‍ර සූත්‍ර ශිල්පීන්, විදුලි කාර්මිකයන්, උදව්කරුවන් ආදි තාක්ෂණික ශ්‍රේණිවල සේවක හිඟය හේතුවෙන් අළුත්වැඩියා ප්‍රමාද වී තිබුණි.

### (ආ) ඉඩම්

(i) නාරාහේන්පිට පිහිටි ඉඩම කැබලි 34 කට මායිම් සලකුණු කරන ලද අතර එයින් කැබලි 13 ක් පමණක් බේස්ලයින් මාර්ග ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන්වූ ජනතාව අතර බෙදා දී තිබුණි. බෙදා නොදෙන ලද ඉතිරි ඉඩම් කැබලි 21 ක් සහ වෙනත් ඉඩම් 2 ක් අරමුණු කළ කාර්යයන් සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ii) හෙක්ටයාර් 2 ක ප්‍රමාණයේ ඔරුගොඩවත්ත පිහිටි වෙනත් ඉඩමක් 2010 වර්ෂයේදී එම ආකාරයෙන්ම අත්කරගෙන තිබුණි. කෙසේ වුවද ඉඩමේ නිත්‍යානුකූල අයිතිය පදිංචිකරුවන්ට පවරා දීමට 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**(ඈ) මෝටර් වාහන**

2012 දෙසැම්බර් 31 දිනට අධිකාරියට අයත් මෝටර් වාහන 55 ක් බාහිර පාර්ශවයන් විසින් භාවිතා කිරීම සඳහා ඉඩ ලබාදී තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඈ) මරදාන ප්‍රධාන ගබඩාව**

අධිකාරියේ අධ්‍යක්ෂ (යාන්ත්‍රික) විසින් කරන ලද ඉල්ලීම මත 2000 හා 2001 වර්ෂවල ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙන් ලැබී තිබුණු මුදලකින් රු.32,679,741 ක් වටිනා උපකරණ මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද එම වත්කම් අරමුණු කළ කාර්යයන් සඳහා යොදාගැනීමෙන් තොරව වර්ෂ 12 කට වැඩි කාලයක් ගබඩාවේ පැවතුණි.

**(ඉ) නාගොඩ- කලවැල්ලාව නිලධාරීන්ගේ නිල නිවාස**

නාගොඩ - කලවැල්ලාව පිහිටි නිලධාරීන්ගේ නිල නිවාස කෙමෙන් දිරා පත්වන තත්ත්වයකට පත්වෙමින් නිෂ්කාර්යව පැවතුණි. 2000 වර්ෂයේදී රු.3,043,238 ක පිරිවැයකට ආරම්භ කර තිබූ නිල නිවාස අළුත්වැඩියා කිරීමේ වැඩ 2012 දෙසැම්බර් 31 වන විටත් නිම කර නොතිබුණි. පසුව එය අත්හැර දමා තිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**(අ) විධිමත් මානව සම්පත් කළමනාකරණ සැලැස්මක් නොමැතිවීම.**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අධිකාරියේ කාර්ය බලකාය, සේවකයන් 8000 ඉක්මවා තිබුණද, මානව සම්පත් කළමනාකරණ කටයුතු සඳහා වෙනම අංශයක් අධිකාරිය විසින්

ස්ථාපිත කර නොතිබුණි. අධ්‍යක්ෂ, පරිපාලන හා මූල්‍ය අංශයේ අධීක්ෂණය යටතේ මානව සම්පත් කළමනාකරණ කාර්යයන් ක්‍රියාත්මක කර තිබුණි.

(ii) මානව සම්පත් ඵලදායීව උපයෝජනය කිරීමේ අරමුණ සඳහා අවශ්‍යතා විශ්ලේෂණයක් (need analysis) මගින් මානව සම්පත් අවශ්‍යතාවය, තීරණය කළ යුතුය. අධිකාරිය විස්තරාත්මක අවශ්‍යතා විශ්ලේෂණයක් ක්‍රියාත්මක කර නොතිබූ අතර මානව සම්පත් කළමනාකරණ සැලැස්මක් ද පිළියෙල කර නොතිබුණි.

(iii) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 ඡේදය අනුව, බඳවා ගැනීම් යෝජනා ක්‍රමය හා උසස්වීම් සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟත්වය සහිතව පාලක මණ්ඩලයේ හා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය අධිකාරිය විසින් ලබාගෙන නොතිබුණි.

**(ආ) වැඩ බැලීමේ දීමනා වැඩිපුර ගෙවීම**

2008 ජනවාරි සිට 2013 පෙබරවාරි දක්වා රාජ්‍ය පුද්ගලික හවුල් ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් අධිකාරියේ අධ්‍යක්ෂවරයකුට රු.648,365 ක වැඩ බැලීමේ දීමනාවක් ගෙවා තිබුණි. කෙසේ වුවද වර්ෂයක් සඳහා පමණක් අධ්‍යක්ෂ පත්කර තිබූ අතර එම ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක නොවේ.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අයවැය ලේඛනමය පාලනය**

ප්‍රාග්ධන වියදම සඳහා විස්තරාත්මක අයවැය ලේඛනයක් අධිකාරිය විසින් ඉදිරිපත් කර නොතිබූ බව නිරීක්ෂණය විය. එබැවින් ප්‍රාග්ධන විෂයයන්වල විශාල විචලනයන් පරීක්ෂා කිරීමට නොහැකි වී තිබුණි. 2012 වර්ෂය සඳහා සංශෝධිත අයවැය ලේඛනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ 2012 නොවැම්බර් 12 දින දීය. එබැවින් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**4.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 18 දින විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබුණි. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අඩුපාඩු අධිකාරියේ කළමනාකාරිත්වයට යොමු කිරීමෙන් පසුව, 2014 මැයි 22 දින කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන ඉවත් කර ගෙන 2014 ජුනි 25 දින සංශෝධිත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි.

**5. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් අධිකාරියේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) මාර්ග නඩත්තුව හා සේවාදායක වැඩ
(ආ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
(ඇ) සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනු හෙළිදරව් කිරීම
(ඈ) ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණය
(ඉ) මෝටර් වාහන උපයෝජනය
(ඊ) ඉඩම් උපයෝජනය
(උ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඌ) ඉන්වෙන්ට්‍රි පාලනය